සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

වර්ෂ අවසාන පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

| 09 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය පැය 02යි. |
|---|---|---|

නම/ විභාග අංකය :- ..........................................................................................................................

# I කොටස

- අංක (01) සිට (20) තෙක් දී ඇති සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ග්‍රීසියේ පෞර රාජ්‍යයක් වන්නේ,

(1) නේපල්ස් (2) ඇතැන්ස් (3) කොසෙන්ස (4) රෝමය

(2) අධිකරණය මගින් දෙන තීන්දුවට එකඟ නොවන්නේ නම් ඉහළ අධිකරණයකට අභියාචනා කළ හැකි ගැටුම් විසඳීමේ ක්‍රමවේදය වන්නේ,

(1) සාකච්ඡා කිරීම (2) උපදේශනය (3) සමථකරණය (4) විනිසීම

(3) ජීවිතය යහපත් ලෙස පවත්වා ගෙන යාමටත්, බියෙන් හා සැකයෙන් තොරව ජීවත් වීමටත් පුද්ගලයෙකුට සමාජයෙන් ලැබෙන රැකවරණය හා ආරක්ෂාව,

(1) සමාජ සුරක්ෂිතතාවය යි (2) සමාජ ශුභ සාධනය යි
(3) සමාජානුයෝජනය යි (4) සහ ජීවනය යි

(4) ''අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී'' කුමාරතුංග මුනිදාසයන්ගේ මෙම වැකියෙන් පෙන්වා දෙන්නේ,

(1) කිසිදු ජාතියක් තාක්ෂණය භාවිත නොකළ යුතු බවය.
(2) තාක්ෂණය භාවිතයෙන් අලුත් දෑ නිපදවාගත හැකි බවය.
(3) තාක්ෂණය අවැසි බවත් නිර්මාණශීලීව යොදාගත යුතු බවය.
(4) සම්ප්‍රදායික තාක්ෂණය භාවිත නොකළ යුතු බවය.

(5) ''පිතෘ භූමිය සඳහා'' යන්න ආදර්ශ පාඨය කර ගනිමින් මව්බිමේ ආරක්ෂාවට කැපවී සිටින ආයතනය වන්නේ,

(1) ශ්‍රී ලංකා පොලීසිය (2) ශ්‍රී ලංකා යුද හමුදාව
(3) ශ්‍රී ලංකා නාවික හමුදාව (4) ශ්‍රී ලංකා ගුවන් හමුදාව

(6) යහජීවනයෙන් කටයුතු කිරීමෙන් අත්වන ප්‍රතිලාභයකි,

(1) අන් අයගේ අයිතිවාසිකම් ආරක්ෂා වීම
(2) බිය සැක සහිතව ජීවත් විය හැකි වීම
(3) අල්ලස, දූෂණය හා වංචාවට යොමු වීම.
(4) තනිව තම අවශ්‍යතා ඉටුකර ගැනීමට පෙළඹීම

(7) සමාජයේ පවත්නා සියලුම රැකියා අවස්ථා හැඳින්වෙන්නේ,

(1) වැඩ ලෝකය යනුවෙනි | (2) සේවා අවස්ථා යනුවෙනි
(3) රැකියා වෙළඳපොළ යනුවෙනි | (4) ශ්‍රමාභිමානය යනුවෙනි

(8) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද බලය අහිමි වීමට බලපාන හේතුවක් වන්නේ

(1) පුරවැසිභාවය අහිමිවීම.
(2) අවුරුදු 18 සම්පූර්ණවීම.
(3) දේශපාලන පක්‍ෂයක නායකයෙකු වීම.
(4) ඡන්දහිමි නාමලේඛනයේ නම ඇතුලත් වීම.

(9) ඍජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය තුළ ක්‍රියාකාරී සහභාගිත්වය හිමි වූයේ නගරවාසී,

(1) කාන්තාවන්ට ය. | (2) විදේශිකයන්ට ය.
(3) වහලුන්ට ය' | (4) වැඩිහිටි පිරිමින්ට ය.

(10) ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට සර්වජන ඡන්ද බලය ලබා දුන් ආණ්ඩු ක්‍රමය වන්නේ,

(1) 1910 - කෲව් මැකලම් | (2) 1920 - මැනිං
(3) 1931 - ඩොනමෝර් | (4) 1947 - සෝල්බරි

(11) ''ජාතික ප්‍රතිපත්ති'' සැකසීම සම්බන්ධ නිවැරදි ප්‍රකාශය මින් කවරක්ද?

(1) දේශපාලන පක්ෂ වල අවශ්‍යතා අනුව සැකසිය යුතු වේ.
(2) පාලකයින්ගේ අභිමතාර්ථ ඉටුවන සේ සැකසිය යුතු වේ.
(3) ජාතික අභිවෘද්ධිය උදෙසා සැකසිය යුතු වේ.
(4) ආණ්ඩු මාරුවන විට වෙනස් කළ හැකි වන සේ සැකසිය යුතු වේ.

(12) සීමිත සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම,

(1) ඵලදායීතාවය යි | (2) කාර්යක්ෂමතාවය යි
(3) කාල කළමනාකරණය යි | (4) සැලසුම්කරණය යි

(13) ''මකරා'' මුල්කරගත් සංස්කෘතිකාංග අනුගමනය කරන ආසියාතික රටක් වන්නේ,

(1) ජපානය (2) ඉන්දියාව (3) බංගලාදේශය (4) චීනය

(14) ගැටුම් සාමකාමීව විසඳා ගැනීමෙන් අත්වන ප්‍රයෝජනයක් වන්නේ,

(1) සමාජ සබඳතා පළුදු වීම ය.
(2) සම්පත් නාස්තිය අවම වීම ය.
(3) මානසික ආතතිය වැඩි වීම ය.
(4) දේශපාලන අස්ථාවර බව ඇතිවීම ය.

(15) පහත I තීරුවේ සඳහන් උසස් පෙළ විෂය ධාරාවන් හැදෑරීමෙන් යොමු විය හැකි රැකියා අවස්ථා II තීරුවේ දැක්වේ. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| I | II |
|---|---|
| 1. කලා | A - පරිගණක |
| 2. වාණිජ | B - නීතිඥ |
| 3. තාක්ෂණ | C - රසායනාගාර ශිල්පී |
| 4. විද්‍යා | D - තක්සේරුකරු |

(1) A D B C (2) B C A D (3) D C A B (4) B D A C

(16) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහ නගර සභාවක පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන්නේ,

(1) පුරපති ය (2) උප සභාපති ය

(3) ලේකම් ය (4) නාගරික කොමසාරිස් ය.

(17) ප්‍රාදේශීය අවශ්‍යතාවල විවිධත්වයට බලපාන සාධකයක් වන්නේ,

(1) සම්පත් වල ව්‍යාප්තිය (2) ජන සංඛ්‍යාව

(3) මූලික අවශ්‍යතා (4) ආර්ථික කටයුතු

(18) රැකියා ඉල්ලුම් පත්‍රයක් පිරවීමේ දී සැලකිය යුතු කරුණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) තමාට අවශ්‍ය තොරතුරු පමණක් සැපයීම

(2) අවසාන දිනය වනතෙක් සිට ඉදිරිපත් කිරීම

(3) අදාල නොවන දේවල් සඳහා හිස්තැන් තැබීම

(4) අසා ඇති දේ සඳහා නිවැරදි පිළිතුරු සැපයීම

(19) ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද පළමු සමූපකාර සමිතිය වන්නේ මින් කවරක්ද?

(1) ගාල්ල රෝහල් සමූපකාර සමිතිය

(2) දුම්බර සමූපකාර ණය දෙන සමිතිය

(3) මහනුවර ධර්මරාජ විද්‍යාලයීය පාසල් සමූපකාර සමිතිය

(4) කොළඹ විවිධ සේවා සමූපකාර සමිතිය

(20) සමාජයක පුද්ගල සම්බන්ධතා හා දේපළ සම්බන්ධ වැරදි ආරවුල් හා හානි සම්බන්ධයෙන් බලපාන නීතිය වන්නේ,

(1) අපරාධ නීතිය (2) පරිසර නීතිය

(3) සිවිල් නීතිය (4) මානව හිමිකම් නීතිය

ලකුණු 2 x 20 = 40

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

වර්ෂ අවසාන පරීක්ෂණය - 2021

09 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය

නම/ විභාග අංකය :- ..........................................................................................................................

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(1) (i) සමාජ සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ආයතන දෙකක් නම් කරන්න.

(ii) ඕනෑම ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලීන් දෙකක් සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලාංකික පුරවැසියකුට ඡන්ද බලය ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම් වලින් දෙකක් ලියන්න.

(iv) පළාත් පාලන ආයතන වල සීමා නිර්ණය කිරීම සඳහා සැලකිල්ලට ගනු ලබන නිර්ණායක දෙකක් සඳහන් කරන්න.

(v) මුදල් ණයට ලබා ගත හැකි ක්‍රමවේදයක් වන ''ණයපත්'' (credit card) භාවිතයේ අවාසි දෙකක් ලියන්න.

ලකුණු 4 x 5 = 20

(2) ''යහජීවනය මෙන්ම සහජීවනයද සමාජ ප්‍රගමණයට හේතු වේ.''

(i) යහජීවන ගුණාංග හතරක් නම් කරන්න. (ලකුණු 2)

(ii) යහජීවන ගුණාංග පුහුණු නොකිරීමෙන් සමාජයට සිදුවන අයහපත් ප්‍රතිවිපාක තුනක් ලියන්න. (ලකුණු 3)

(iii) සහජීවන ගුණාංග ජීවිතයට අදාල කර ගැනීමෙන් අත්වන ප්‍රතිලාභ තුනක් සඳහන් කරන්න. ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(3) ප්‍රජාතන්ත්‍රවාදය යනු මහජනයාගේ කැමැත්ත මත ගොඩනැගුණු පාලන ක්‍රමයකි.

(I) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 2)

(ii) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන මැතිවරණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) A මැතිවරණ සම්බන්ධ පුරවැසි යුතුකම් තුනක් ද
B ඡන්ද බලය ප්‍රකාශ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 5)

(4) ''ප්‍රාදේශීය අවශ්‍යතා වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව පළාත් පාලන ආයතන මගින් ඉටු කරයි.''

(I) වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වලින් දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) පළාත් පාලන ආයතනයකට මූල්‍ය සම්පත් උපයා ගන්නා ක්‍රමවේද තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) පළාත් පාලන ආයතන වලින් සේවාවන් ලබා ගැනීමේදී මහජනතාව විසින් ඉටුකළ යුතු යුතුකම් තුනක් සඳහන්කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(5) තාක්ෂණයේ වෙනස්කම් නිසා සමාජයේ විවිධ ක්ෂේත්‍රවල වෙනස්කම් ඇතිවේ.

(I) වර්තමානයේ තාක්ෂණය භාවිතයට ගන්නා අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 2)

(ii) යෝග්‍ය තාක්ෂණය භාවිතයෙන් අත්වන ප්‍රතිලාභ තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

(iii) මිනිසා බහුල ලෙස තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීම නිසා ඇතිවී තිබෙන
A හිතකර ප්‍රතිඵල තුනක් ද,
B අහිතකර ප්‍රතිඵල දෙකක් ද ඉදිරිපත් කරන්න. (ලකුණු 5)

(6) ''වැඩ ලෝකය සාමාන්‍ය ලෝකය මෙන්ම විචිත්‍රවත්ය.''

(i) රැකියා දැන්වීමක් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි ප්‍රධාන ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ඉල්ලුම් පත්‍රයක කටු පිටපතක් සැකසීමෙන් අත්වන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 3)

(iii) සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් සඳහන් කරන්න. ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

(7) ''ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම ජන සමාජයේ යහපැවැත්මට හේතු වේ.''

(i) ගැටුම් ඇති වීමට බලපාන හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 2)

(ii) ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය ගුණාංග තුනක් ලියන්න. (ලකුණු 3)

(iii) ගැටුම් ශුභවාදීව විසඳා නොගැනීමෙන් අත් විය හැකි ප්‍රතිවිපාක කරුණු තුනක් ඇසුරින් ඉදිරිපත් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE

වර්ෂ අවසාන පරීක්ෂණය - 2021

09 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය

පිළිතුරු පත්‍රය

**I කොටස**

| | | | |
|---|---|---|---|
| (1) 2 | (6) 1 | (11) 3 | (16) 3 |
| (2) 4 | (7) 1 | (12) 2 | (17) 1 |
| (3) 1 | (8) 1 | (13) 4 | (18) 4 |
| (4) 3 | (9) 4 | (14) 2 | (19) 2 |
| (5) 2 | (10) 3 | (15) 4 | (20) 3 |

**II කොටස**

(1) (I) පවුල, පාසල, ආගමික, ආයතන, සමාජ ආයතන ..... ඇතුළත් ගැලපෙන පිළිතුරු සඳහා

(ii) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම, වයස අවුරුදු 18 සම්පූර්ණ වීම, ඡන්ද හිමි නාම ලේඛණයේ නම ඇතුළත් කර තිබීම, ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි කර නොතිබීම.

(iv) ජනවාර්ගික ජනගහන අනුපාතය, ජනගහනය හා ජන ඝනත්වය
ආර්ථික සංවර්ධන මට්ටම, ජනගහනය හා ජන ඝනත්වය

(v) ඉහළ පොළී අනුපාත අය කිරීම, අමතර ගාස්තු අය කිරීම, දීර්ඝ කාලීන ණය කරුවකු බවට පත්වීම, ක්ෂණිකව කොන්දේසි වෙනස් කිරීම, ඔරොත්තු නොදෙන පරිභෝජනයකට පෙළඹීම......... ආදී. ලකුණු $4 \times 5 = 20$

(2) (I) නීති ගරුක බව, උත්සාහවන්ත බව, අවංක බව, කරුණාව, ඉවසීම, ධාර්මික බව, සුහදශීලී බව, ධෛර්යවන්ත බව, පරිත්‍යාගශීලී බව........ ආදිය.

(ii) යහපැවැත්ම බිඳවැටීම, අන්තර් පුද්ගල සබඳතා බිඳ වැටී පුද්ගලයන් හුදකලා වීම, ආතතිය වැඩිවීම, අපචාර වැඩිවීම, අල්ලසට හා දූෂනයට යොමුවීම, සමාජ සාමය බිඳ වැටීම, සමාජ විරෝධී ක්‍රියා වැඩි වීම..... ආදිය

(iii) සමාජ සුරක්ෂිතතාව තහවුරු වීම, ගැටුම් අවම වීම, සාමය ස්ථාපිත වීම, පුද්ගල සංවර්ධනය සිදුවීම, අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය වීම.
(එක් කරුණක් විස්තර කිරීම) ලකුණු 2 + 3 + 5 + 10

(3) (I) නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක වීම, නිදහස් ජනමාධ්‍ය පැවතීම, බහුතර කැමැත්ත මත තීරණ ගැනීම, නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම, සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාලන කටයුතු සිදු කිරීම........... ආදිය

(ii) ජනාධිපතිවරණය, මහ මැතිවරණය (පාර්ලිමේන්තු මැතිවරණය), පළාත් සභා මැතිවරණය, පළාත් පාලන මැතිවරණ

(iii) A ඡන්දය ප්‍රකාශ කිරීම, මැතිවරණ නීති රීති වලට අවනත වීම, ප්‍රචණ්ඩ ක්‍රියාවලින් වැළකීම, ජය පරාජය සමසේ භුක්ති විඳිමින් අන් අයගේ අයිතිවාසිකම් වලට ගරු කිරීම ...... ආදිය

B උගත් බුද්ධිමත්, ආදර්ශවත් නායකයන් තෝරා ගැනීම, මැතිවරණ ප්‍රකාශන ප්‍රතිපත්ති පිළිබඳ සැලකිලිමත් වීම, ජාතික අරමුණු හා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට කැපවී සිටින නායකයන් තෝරා ගැනීම........ ආදිය

(9 ශ්‍රේණිය පෙළපොත පිටු අංක 82/83)

(4) (I) ප්‍රාදේශීය සභා, නගර සභා, මහනගර සභා

(ii) පළාත් පාලන අමාත්‍යවරයා වෙන් කරනු ලබන ප්‍රදාන, පොදු සේවා සැපයීමෙන් ලබන ආදායම්, දේපළ බදු දීම, කුලියට දීම, දඩ මුදල්..........

(iii) කලට වේලාවට නියමිත බදු ගෙවීම, සපයන සේවා සඳහා නිසි පරිදි බිල්පත් ගෙවීම, පරිසර සංරක්ෂණයට දායක වීම, කසල කළමනාකරණය නිසි උපදෙස් අනුව සිදු කිරීම... ආදී කරුණු තුනක් දැක්වීම හා එකක් විස්තර කිරීමට ලකුණු 2 + 3 + 5 + 10

(5) (i) විවිධ ගෘහ අවස්ථා, අධ්‍යාපනය, ප්‍රවාහනය, සෞඛ්‍ය ආදී සේවා, විවේකය හා විනෝද කටයුතු, සමාජ සබඳතා ගොඩ නැගීම, නව නිපැයුම් බිහි කිරීම.

(ii) සම්පත් අපතේ යාම වැළකීම, ශ්‍රම සම්පතින් උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වීම, පරිසර හානිය අවම වීම, පාරිසරික තුලිතතාව රැක ගත හැකි වීම, ආර්ථිකයට දරා ගත හැකි වීම.

(iii) A වැඩ පහසු වීම, ඵලදායීතාව වැඩිවීම, කාර්යක්ෂමතාව වැඩිවීම, කාලය ඉතිරිවීම, සම්පත් නාස්තිය අවම වීම, සමාජ සබඳතා පුළුල් වීම.

B මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම, අනවශ්‍ය පරිභෝජන රටාවලට යොමුවීම, පරිසර දූෂනය වේගවත් වීම, විවිධ ලෙඩරෝග වලට මිනිසා ගොදුරු වීම.... ආදී

ලකුණු 2 + 3 + 5 + 10

(6) (i) ජීව දත්ත පත්‍රිකාවක් මගින්, රැකියා ඉල්ලුම් පත්‍රයක් මගින්, ලිපියක් මගින්

(ii) එක්වර ලිවීමේ දී ඇතිවන අඩුපාඩු මහ හරවා ගත හැකි වීම.
අනවශ්‍ය කරුණු සටහන් කර ඇති නම් ඉවත් කළ හැකි වීම, පිටපතක් තබා ගත හැකි වීම, වඩා නිවැරදි ඉල්ලුම් පතක් පිරිසිදු නිමාවකින් යුතුව පිළියෙල කරගත හැකි වීම....ආදිය

(iii) පෞද්ගලික පෙනුම, ශරීර භාෂාව, අවධානය හා උනන්දුව, කථනය හා බස හැසිරවීම, ආචාර සම්පන්න හැසිරීම. ලකුණු 2 + 3 + 5 + 10

(7) (I) නූගත්කම, ආත්මාර්ථකාමී බව, ආක්‍රමණශීලී බව, සම්පත් විසංතුලනය, විවිධ මතවාද සමාජානුයෝගී නොවීම.... ආදි

(ii) ඉවසීම, සක්‍රීයව සවන් දීම, පරිත්‍යාගශීලී බව, මධ්‍යස්ථ බව, කාරුණික බව, අයිතිවාසිකම් වලට ගරු කිරීම ....... ආදිය

(iii) මානසික ආතතිය ඇතිවීම, සමාජ සම්බන්ධතා පළුදු වීම, සමාජ සබඳතා පළුදු වී, සම්පත් විනාශ වීම, තිරසාර සාමය බිඳ වැටීම, අපකීර්තියට පත්වීම........ ආදී කරුණු තුනක්. එක් කරුණක් පැහැදිලි කිරීම. ලකුණු 2 + 3 + 5 + 10